සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

පළමු වාර පරීක්ෂණය 2015

විද්‍යාව

06 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දී ඇති ප්‍රකාශන නිවැරදි නම් ඉදිරියෙන් (✓) ලකුණද, වැරදි නම් (x) ලකුණද යොදන්න..

01 ප්‍රභාසංස්ලේෂණය ජීවීන් සතු පොදු ලක්ෂණයකි. ( )

02 ස්කන්ධය ප්‍රකාශ කිරීමේ සම්මත ඒකකය කිලෝග්‍රෑම් වේ. ( )

03 කතුරු මුරුංගා පත්‍ර අතින් ඇල්ලූ විට හැකිලෙමින් චලනයක් දක්වයි. ( )

04 ජලයට නිශ්චිත පරිමාවක් නැත. ( )

05 "සංචරණය" සතුන් තුළ දැකිය හැකි වුවත් බොහෝ ශාක තුළ දැකිය නොහැකිය. ( )

- වරහන් තුළ දී ඇති වචන අතුරින් වඩාත් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.

06 හරිත ශාකවල ආහාර නිෂ්පාදනය සඳහා කාබන් ඩයොක්සයිඩ් වායුව සහ .... අවශ්‍ය වේ. (ජලය / වාතය)

07 යම් ද්‍රව්‍යයකට මිටියකින් ගැසූ විට තැලීම සිදුවීම .... නම් වේ. (තන්‍යතාව/ ආඝාතවර්ධ්‍යතාව)

08 ලුණු ලේවා තුළදී ජලය .... කර ලුණු (සෝඩියම් ක්ලෝරයිඩ්) නිපදවයි. (වාෂ්පීභවනය / වාෂ්පීකරණය)

09 කලපු වල ඇති ජලය .... ලෙස හැඳින්වේ. (කිවුල්දිය / කරදිය)

10 ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය සඳහා යොදාගන්නා උපකරණය වන්නේ .... යි. (අවතල කාචය / අන්වීක්ෂය)

- දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11 හරිත ශාක ප්‍රභාසංස්ලේෂණයේදී පරිසරයට නිදහස් කරන වායුව වන්නේ,
(1) කාබන්ඩයොක්සයිඩ් (2) ඔක්සිජන්
(3) නයිට්‍රජන් (4) ජල වාෂ්ප

12 සමනලයාගේ පෝෂණ ක්‍රමය වන්නේ,
(1) ශාක භක්ෂක (2) මාංශ භක්ෂක (3) සර්ව භක්ෂක (4) පරපෝෂී

13 අත් ආවරණ තැනීමේදී 'රබර්' නම් වූ ද්‍රව්‍යය යොදාගැනීමට හේතුව වන්නේ,
(1) ප්‍රත්‍යාස්ථ ගුණය නිසා (2) ආඝාත්‍ය ගුණය නිසා
(3) සුවිකාර්ය ගුණය නිසා (4) තන්‍යතාව නිසා

14 ශක්ති ප්‍රභේදයක් නොවන්නේ,
(1) ආලෝකය (2) තාපය (3) ධ්වනිය (4) වාතය

15 ජලය වායු අවස්ථාවේ පවතින ආකාරයක් වන්නේ,
(1) හුමාලය (2) මීදුම (3) ග්ලැසියර් (4) හිම

16 නිශ්චිත ද්‍රව පරිමාවක් මැනගැනීම සඳහා විද්‍යාගාරයේදී භාවිත කරන උපකරණය වන්නේ,
(1) බීකරය (2) කේතු ප්ලාස්කුව (3) පරීක්ෂණ නලය (4) මිනුම් සරාව

17 මුදුන් මුලක් සහිත ශාකයක් වන්නේ,
(1) කජු (2) පොල් (3) උක් (4) ගොයම්

18 ශ්වසනය සඳහා කෘත්‍රිමව ඔක්සිජන් වායුව ලබා නොගන්නා අයෙකු වන්නේ,
(1) කඳු නගින්නන් (2) කිමිදුම්කරුවන් (3) ක්‍රීඩකයන් (4) අසාධ්‍ය රෝගීන්

19 විද්‍යාගාරයෙන් ලබාගන්නා හුණු දියර ස්වල්පයක් පරීක්ෂණ නලයකට ගෙන එය තුළට බීම බටයක් යොදා කටින් පිඹිමින් ප්‍රශ්වාස වාතය බුබුලනය කිරීමේදී, පරීක්ෂණ නළයේ ඇති ද්‍රාවණයේ දක්නට ලැබෙන නිරීක්ෂණය වන්නේ,

(1) ලා නිල් පැහැයට හැරීම (2) කිරි පැහැයට හැරීම.

(3) පතුලේ දුඹුරු පැහැති ද්‍රව්‍යයක් තැන්පත් වීම. (4) රෝස පාට වීම

20 වීදුරු කැපීම සඳහා යොදාගන්නා උපකරණයට භාවිතා කර ඇති ද්‍රව්‍ය වන්නේ,

(1) මිනිරන් (2) පළිඟු (3) වානේ (4) දියමන්ති

II - කොටස

- **ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **මෙම පත්‍රයේම දී ඇති හිස්තැන් වල පිළිතුරු ලියන්න.**

01 6 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් ජෛව ගෝලයේ අසිරිය අධ්‍යයනය කිරීමට සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවකදී භාවිතා කළ සටහන් පොතේ පිටු දෙකක් පහත දැක්වේ.

නිරීක්ෂණය කළ දෑ	එකතු කළ නිදර්ශක
සමනලයා, නිදිකුම්බා ශාකය, ගිරවා, දළඹුවන්, ගොලුබෙල්ලන්, පොල්ගස, විශාල කලු ගල, ජලය පිරි පොකුණ, බඩගා ගිය සර්පයෙක්, කොස් ගසක්	❖ පොකුණෙන් ලබාගත් ජලය ස්වල්පයක් ❖ කුරුළු පිහාටු කිහිපයක් ❖ විවිධ පැළෑටි කිහිපයක් ❖ ශාක පත්‍ර ❖ මිය ගිය සමනලයෙක්

(1) ගසක මුදුනේ අත්තක සිටි ගිරවාගේත්, ශාක පත්‍රයක් මත සිටි දළඹුවාගේත් දේහ කොටස් පැහැදිලිව නිරීක්ෂණය සඳහා ඔවුන් යොදාගත් උපකරණ දෙක සඳහන් කරන්න.

(i) ගිරවා .... (ii) දළඹුවා .... (ල. 02)

(2) මෙම චාරිකාවේදී ජීවිත හානියක් පවා සිදුකිරීමට ඉඩ ඇති ඉහත සටහනේ දැක්වෙන සත්ත්වයා නම් කරන්න. (ල. 01)

....

(3) එම සතුන්ගෙන් ආරක්ෂා වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න. (ල. 01)

....

(4) ඉහත සටහනේ දැක්වෙන

(a) අජීවී ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(i) .... (ii) ....

(b) නිදිකුම්බා ශාකයේ විශේෂ ලක්ෂණයක් සඳහන් කරන්න. (ල. 01)

....

(5) ජලය පිරී තිබූ පොකුණේ බොහෝ විට වාසය කිරීමට ඉඩ ඇති සත්ත්වයින් දෙදෙනෙක් නම් කරන්න.

(i).. (ii)..(ල. 01)

(6) නිදර්ශක ලෙස එකතු කරගත් ජලය විද්‍යාගාරයේ අන්වීක්ෂය මගින් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය කළ හැක්කේ කුමන වර්ගයේ ජීවීන් ද? (ල. 01)

....

(7) එම ජීවීන්ගෙන් ලබා ගන්නා ප්‍රයෝජනයක් හා හානියක් සඳහන් කරන්න. (ල. 02)

ප්‍රයෝජනය ....

හානිය ....

(8) ක්ෂේත්‍ර චාරිකාවක දී ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා භාවිතා කිරීමට රැගෙන යා යුතු උපකරණ 6 ක් සඳහන් කරන්න. (ල. 03)

....

....

(9) මෙවැනි ක්ෂේත්‍ර අධ්‍යයනයකදී ඔබට හමුවන, ජීවී හෝ අජීවී ලෙස වර්ග කළ නොහැකි දෙයක් සඳහන් කරන්න. (ල. 01)

....

....

02 (1) ජීවීන්ගේ පොදු ලක්ෂණ 05 ක් ලියන්න. (ල. 05)

(i) .... (ii) ....

(iii) .... (iv) ....

(v) ....

(2) ශාක හා සතුන් අතර ඇති වෙනස්කම් පිළිබඳ වගුවක් පහත දැක්වේ. එම වගුවේ හිස්තැන්වලට අදාළ පිළිතුර ලියන්න.

	ශාකවල ලක්ෂණ	සතුන්ගේ ලක්ෂණ
1.	චලන දක්වයි.	....
2.	....	විෂම පෝෂී වේ.
3.	....	හරිතප්‍රද ඇත.
4.	වර්ධනයේ සීමාවක් නැත.	....

(ල. 04)

(3) පෙහත සඳහන් සතුන් දෙබෙදුම් සුචියක් මගින් වර්ගීකරණය කරන්න.

ගැඩවිල්පණුවා, ගවයා, හාවා, කපුටා (ල. 06)

The National e-Learning Portal for The General Education

03 පදාර්ථය අවස්ථා 03 කින් පවතී.

(1) පදාර්ථය සතු ලක්ෂණ 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(i) .... (ii) ....

(2) ඉහත ඔබ සඳහන් කළ ලක්ෂණ නොමැති දෑ කුමන නමකින් හැඳින්වේද?

.... (ල. 01)

(3) එම ද්‍රව්‍ය සඳහා උදාහරණ 02 ක් ලියන්න. (ල. 02)

(i) .... (ii) ....

(4) පදාර්ථය පවතින ප්‍රධාන අවස්ථා 03 සඳහන් කරන්න. (ල. 03)

(i) .... (ii) .... (iii) ....

(5) නිශ්චිත පරිමාවක් ඇති, නිශ්චිත හැඩයක් නැති පදාර්ථ කුමන අවස්ථා වේ පවතීදැයි සඳහන් කරන්න. (ල. 01)

....

(6) 

මෙම රූපයෙන් දැක්වෙන්නේ පන්ති කාමරයේදී විද්‍යාව විෂය සඳහා සිසුන් සිදුකළ ක්‍රියාකාරකමකි. A හා B බැලුන් තිරස්ව පිහිටා ඇත.

(a) A හා B බැලුන් තිරස්ව පිහිටීමට හේතුව කුමක්ද? (ල. 01)

....

(b) A බැලුනය සිදුරු කළහොත් සමබරතාවයට කුමක් සිදුවේද? (ල. 01)

....

(c) A බැලූනය සිදුරු කිරීමෙන් පසුව A හා B බැලූන් වල පිහිටීම රූප සටහනකින් දක්වන්න. (ල. 04)

04 පෘථිවිය මත ඇති ජලය ඝන, ද්‍රව, වායු යන අවස්ථා 3 හිම පවතී.

(1) පෘථිවිය මත ජලය ඝන අවස්ථාවේ පවතින ආකාර 03 ක් සඳහන් කරන්න. (ල. 03)

(i) .... (ii) .... (iii) ....

(2) ජලය ද්‍රව වශයෙන් පවතින ප්‍රධාන ආකාරය වර්ෂණයයි. වර්ෂණය සිදුවන ආකාර දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(i) .... (ii) ....

(3) පොලොව මත ජලය ද්‍රව ලෙස පවතින අනෙක් ආකාර 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(i) ....

(ii) ....

(4) දිය වී ඇති ලවණ ප්‍රමාණය අනුව ජලය ප්‍රධාන වර්ග 03 කට බෙදිය හැකිය. එම වර්ග 03 නම් කරන්න. (ල. 03)

(i) .... (ii) .... (iii) ....

(5) අප ආහාරයට ගන්නා ලුණු නිපදවීමට යොදාගන්නේ ඉහත වර්ග 03 න් කුමන ජලයද?

.... (ල. 01)

(6) ජීවීන්ගේ දේහ ක්‍රියාකාරීත්වය සඳහා ජලය දායක වන ආකාර 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(i) .... (ii) ....

(7) පරිභෝජනය සඳහා ලබාගත හැක්කේ පෘථිවියේ ඇති මුළු ජලයෙන් කොපමණ ප්‍රතිශතයක්ද? .... (ල. 02)

05 පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

(1) සර්පයින්ගේ සංචරණය කුමන නමකින් හැඳින්වේද? .... (ල. 01)

(2) ආශ්වාස වාතයට වඩා ප්‍රශ්වාස වාතයේ අඩංගු වායුව කුමක්ද? .... (ල. 01)

(3) ශාකවල ආහාර නිෂ්පාදනය සඳහා පොළොවෙන් ලබාගන්නා ද්‍රව්‍ය හා වායුගෝලයෙන් ලබා ගන්නා ද්‍රව්‍ය සඳහන් කරන්න.

(a) පොළොවෙන් ....

(b) වායුගෝලයෙන් .... (ල. 02)

(4) ද්‍රවයක පරිමාව මැනීමට විද්‍යාගාරයේදී යොදාගන්නා උපකරණය කුමක්ද? (ල. 02)

....

(5) භංගුරතාවය යනු කුමක්ද? . (ල. 02)

(6) කම්බි සෑදීමට සුදුසු ද්‍රව්‍යයන් 02 ක් නම් කරන්න. (ල. 02)

(i) .... (ii) ....

(7) ආහාරයට ගන්නා ලුණුවල රසායනික නම ලියන්න. .... (ල. 02)

(8) වර්ෂාපතනය මනින උපකරණය කුමක්ද? .... (ල. 02)

(9) මිරිදිය ලීටර් 1 ක සහ කරදිය ලීටර් 1 ක පරිමාවක ස්කන්ධයන් අතුරින් වඩා වැඩි ස්කන්ධයක් ඇත්තේ කුමන ජලයේද? .... (ල. 01)